විද්‍යාලය : ර/ ඇඹිල්පොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 12 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර

කර්තෘ කාරක වාක්‍යයක් කර්ම කාරක වාක්‍යයක් බවට පත් කිරීමේ දී පහත සඳහන් පිළිවෙළ අනුගමනය කරන්න.

- කර්තෘ කාරක වාක්‍යයේ ඇති උක්තය අනුක්ත බවට පත් කරන්න.
- එම අනුක්ත කර්තෘ පදයට 'විසින් ' නිපාත පදය එකතු කරන්න.
- අනුක්ත ව පැවති කර්මය උක්ත කරන්න.
- උක්ත කර්මයට අනුව අවසාන ක්‍රියාව තබන්න.

උදා :- ගුරුවරු ශිෂ්‍යයන් ආරක්ෂා කරති. (කර්තෘ කාරක)
ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ ආරක්ෂා කෙරෙති. / කරනු ලබති. (කර්ම කාරක)

**පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.**

1. මම සෑම විට ම ගුරුවරුන් නමදිමි.
2. රජය ගුරු දිනය වෙනුවෙන් උත්සවයක් පවත්වයි.
3. සිංහල සාහිත්‍ය සංගමය නව නිලධාරීන් තෝරයි.
4. ගුරුවරු ශිෂ්‍යයන් යහමග යවති.
5. ගුරුතුමිය දරුවන් ආරක්ෂා කරයි.
6. ගුරුතුමා මා ඇමතුවේය.
7. ශිෂ්‍යයෝ පා පන්දු ක්‍රීඩා කළහ.
8. විදුහල්පතිතුමා උදෑසන රැස්වීම ඇමතුවේය.
9. දෙසව්පියෝ දරුවන් ආරක්ෂා කළහ.
10. නීතීඥයෙක් විත්තිකරුවෙකු ඇමතුවේය.